අඹගමුව ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

---------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 28 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්.

ලැබිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.175,074,019ක ප්‍රාග්ධන ආධාර ගිණුමේ ශේෂය තුළ අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.10,350,045 ක් විය.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.182,510,222ක් වූ අතර ඒ තුළ අවු.01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.19,397,262 ක් වී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,185,941ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,666,978ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.3,481,037ක පිරිහීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු.3,481,037ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2014 වර්ෂයේදී ආදායම් විෂයයන් 02ක ආදායම සියයට 1 සිට සියයට 6ක පරාසයකින් අඩුවීමත් වියදම් විෂයයන් 05ක වියදම සියයට 7 සිට සියයට 100 දක්වා වූ පරාසයකින් වැඩිවීමත් හේතු වි තිබුණි.

සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.27,470,364 ක් ලැබී තිබුණු නමුත් වැටුප් හා දීමනා ලෙස රු.45,333,534 ක් ගෙවා තිබුණි. ඒ අනුව සභාවේ ආදායමෙන් රු.17,863,170 ක මුදලක් සභා සේවකයින් වැටුප් ගෙවීමට වැය කර තිබුණි. එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමින් 42.33%ක් විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2014.01.01 දිනට හිඟය | 2014.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල්කීරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2014.12.31 දිනට හිඟ: 2014.01.01 දිනට පැවති හිඟයෙන් | 2014.12.31 දිනට හිඟ: වර්ෂයේ බිල්කිරීම් වලින් | 2014.12.31 දිනට හිඟ: මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 2,487,595 | 899,643 | 7,049,510 | 6,204,062 | 1,587,952 | 845,448 | 2,433,400 |
| බදු කුලී | 1,997,010 | 110,924 | 7,756,825 | 7,691,702 | 1,886,086 | 65,123 | 1,951,209 |
| බලපත්‍ර ගාස්තු | 182,421 | - | 3,506,680 | 3,506,680 | 182,421 | - | 182,421 |
| වෙනත් | 4,513,740 | 229,429 | 1,092,739 | 656,056 | 4,284,311 | 436,683 | 4,720,994 |

2.3.2 බදු කුලී.

(අ). 2000 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකළ තක්සේරුවට අනුව හොන්සි දෙමහල් ගොඩනැගිල්ලේ මාසික තක්සේරු කුලිය රු.9,500ක් වුවත් දැනට එම ගොඩනැගිල්ලෙන් 1999 වර්ෂයේ සිට රු.1,500ක මාසික ආදායමක් පමණක් අයවෙමින් පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේදී වැසිකිළි බදුදීම මගින් රු.1,500,000ක ආදායමක් උපයාගැනීමට ඇස්තමේන්තුගත කර තිබුණද ඉන් උපයාගත් තත්‍ය ආදායම රු.282,000ක් විය.

(ඇ) වටවල පොදු වෙළඳපළේ අංක 05 දරන කඩකාමරය බදුකරුවන් විසින් 2003 ජනවාරි 30 දින රු.170,000කට අතුරු බදුදීමක් සිදුකර තිබුණද, ඒ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද ගිනිගත්හේන පොදු වැසිකිළිය ටෙන්ඩර් මගින් බදුදී සභාවට ආදායමක් ඉපයීමට සභාව කටයුතු කර නොතිබුණද එම වැසිකිළිය පරිහරණය කරන පුද්ගලයින්ගෙන් බාහිර පාර්ශවයක් විසින් මුදල් අය කර තිබුණ බව 2015 මාර්තු 20 දින කරන ලද විගණනයේදි නිරීක්ෂණය විය

2.3.3 බලපත්‍ර ගාස්තු

---------------

නියැදි විගණන පරීක්ෂණයට අනුව සහා බලප්‍රදේශය තුළ පිහිටි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් 4කින්, වාණිජ බැංකු ශාඛා 12කින් සහ තේ කර්මාන්තශාලා 03කින් අයවිය යුතු බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 මස්කඩ කුලී

--------------

2003 වර්ෂයේ සිට 2013 වර්ෂයේ අවසාන කාලය දක්වා පැවතෙන රු.1,288,260ක මස්කඩ හා මාළුකඩවල හිඟ කුලී මුදල් අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.5 වෙනත් ආදායම්

------------------

2013 වර්ෂයේ වාහන ලියාපදිංචි කරගැනීම වෙනුවෙන් ත්‍රීරෝද රථ සංගම් 26කින් රු.1,206,000ක් අයවී තිබුණද, වාහන නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථා සැකසීමේ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2014 නොවැම්බර් 30 දින වන විටද අයවී තිබුණේ ත්‍රිරෝද සංගම් 17කින් රු.419,400ක් පමණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 2,282,920 |
| මුද්දර ගාස්තු | 3,176,946 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඔප්පු සහ පිඹුරුපත් සකස්කර නොගැනීම හේතුවෙන් සභාව සතු රු.95,534,439ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබුණි

3.2 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). වෙන්දේසියේ අලෙවිකිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක හෝ වෙනත් කමිටුවක හෝ මෝටර් රථ පරීක්ෂකවරයෙකුගේ නිර්දේශයක් ලැබී නොතිබුණු අංක CPGH – 8124 දරන කැබ් රථය 2014 සැප්තැම්බර් 25 දින රු.1,675,000කට වෙන්දේසියක් මගින් විකුණා තිබූ අතර වෙන්දේසියට ආසන්න මාස 05ක් තුළ රු.178,576ක් වැයකර නව ටයර් යොදා තිබුණි.

(ආ). 2013 වර්ෂය තුළ සභාව සතු වාහන 05ක් සඳහා බැටරි 02ක් ටයර් 46ක් සහ රු.737,165ක් වටිනාකමැති අමතර කොටස් අළුතින් යොදා තිබුණද, එම අවස්ථාවන් වලදී එම වාහන වලින් ඉවත්කරන ලද පැරණි බැටරි, ටයර් හා අමතර කොටස් ආපසු භාරදී ඇති බව විගණනයට තහවුරු නොවුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව අඹගමුව කෝරළයේ දහම් පාසල් ගුරු උපහාර උළෙල සඳහා කාන්තා කුඩ 125ක් මිලදීගැනීම සඳහා රු.39,844ක් වැයකර තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු
---------------------------

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් මස්කෙළිය බස් නැවතුම්පොළේ 2013 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා කාලයට අදාළව රු.24,637ක විදුලි බිල්පත් ප්‍රාදේශීය සභාව මගින් ගෙවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

බගවන්තලාව නගරයේ බස්නැවතුම්පොල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පිළිබඳ 2015 මාර්තු 20 දින කරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

i. ප්‍රමාණ පත්‍රයේ වැඩ විෂය අංක 8.2 අනුව දොර උළුවහු 4"x 3" ප්‍රමාණයෙන් වියයුතු වුවත් සවිකර තිබුණු දොර උළුවහු 21ක් 3 ¾ " x 3" ප්‍රමාණයේ ඒවා විය.

ii. වැඩ බිමට සපයා තිබුණු වැර ගැන්වීම් දගර වානේ කම්බි සඳහා ISO හෝ SLS ප්‍රමිති සහතික තිබු බවට සනාථ නොවූ අතර භාවිතයට පෙර ඉංජිනේරු අනුමැතියක් ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි.

3.5 හඳුනාගත් අලාභ
-------------------

2013 දෙසැම්බර් 31 දිනට අදාළව සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා අනුව මහජන පුස්තකාල 09ක රු.578,655 ක් වටිනාකමැති අස්ථානගතවූ පොත් 5475 ක් හා 2014 දෙසැම්බර් 31 දිනට අදාළව සිදුකළ භාණ්ඩ සමීක්ෂණයට අනුව රු.110,923ක් වටිනාකමැති අස්ථානගත පුස්තකාල පොත් 858ක් හා මහජන පුස්තකාල 02ක පැවති උපකරණ 40ක ඌණතාවයෙහි වටිනාකම ගණන්බලා ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය.
------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 05ක 7% සිට 46% දක්වාද වියදම් විෂයයන් 07ක 13% සිට 100% දක්වාද විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ ආදායම් ශීර්ෂයන් 06ක ඇස්තමේන්තුගත ආදායමින් රු.9,023,385 ක් උපයාගැනීමට සභාව සමත්වී නොතිබුණු අතර වැය ශීර්ෂ 06ක ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.15,422,031 ක් වැයකර තිබුණද අධිවැය සඳහා විධිමත් අයුරින් වැය මාරුකිරීමක් හෝ පරිපූරක අයවැයක් මගින් ප්‍රතිපාදන සලසාගැනීමට සභාපතිවරයා කටයුතු කර නොතිබුණි.

(ඇ). පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් වැය ශීර්ෂයට වාර්ෂික අයවැය මඟින් හෝ වැය මාරුකිරීමක් මගින් පරිපූරක අයවැයක් මඟින් හෝ කිසිදු මුදලක් ප්‍රතිපාදනය කර නොතිබියදී එම වැය ශීර්ෂයට අදාළව රු.513,386 ක වියදමක් සිදුකර තිබුණි.

(ඈ). ආදායම් ශීර්ෂ 02කට අයත් උප අය විෂයයන් 02ක් සඳහා අයවැයගත කළ රු.1,250,000 ක් වූ ආදායම් අයවීමේ ප්‍රතිශතය 0%ක් විය.

(ඉ). ආදායම් ශීර්ෂ 03කට අයත් උප අයවිෂයයන් 07ක් සඳහා අයවැයගත රු.4,300,000 ක්වූ ආදායම් අයවීමේ ප්‍රතිශතය 50%කට හෝ ආසන්න මට්ටමක නොපැවතුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 උප පරිච්ඡේද ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් භාවිත කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය
-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්
---------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 06 කට පිළිතුරු සපයා නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අභ්‍යන්තර පාලනය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). ණයගැති ණයහිමි පාලනය.

(ඈ). වත්කම් කළමනාකරණය.

(ඉ). තොග පාලනය.

(ඊ). කොන්ත්‍රාත් පාලනය.